Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**08 ශ්‍රේණිය**

# පුරවැසි අධ්‍යාපනය

**කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**

---

- **1- 5 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

01. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවාවක් ලෙස ................................................................ දැක්විය හැකි ය.

(බැංකු සේවා, අධ්‍යාපන සේවා, සෞඛ්‍ය සේවා)

02. ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ශ්‍රී ලංකාව ............................................................ දුරු කල රටක් බවට ප්‍රකාශ කරන ලදී.

(මැලේරියාව, බරවා, පෝලියෝ)

03. කාර්මික හා තාක්ෂණික දියුණුව නිසා සීග්‍ර වර්ධනයකට ලක් වී ඇති පොදු සේවාවක් ලෙස ............................. ...................................................... සේවාව දැක්විය හැකි ය.

(ප්‍රවාහන, සෞඛ්‍ය, සන්නිවේදන)

04. ගැමි සැරිය ප්‍රවාහනයේ පහසුව සඳහා ...................................................... යොදවා ඇති සුවිශේෂී පහසුකමකි.

(සිසු දරුවන්ට, ග්‍රාමීය ජනතාවට, ඇඟලුම් සේවකයින්ට)

05. තම අයිතිවාසිකම් බුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම ..................................................................... තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි.

(පාසල, පවුල, පන්සල)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා පාසල ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකමක් ලෙස අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම දැක්විය හැකි ය. (    )

07. අපගේ සිත්තුළ ඇතිවන විවිධ සිතුවිලිවල ස්වභාවය මුහුනේ ඉරියව්වලින් පැහැදිලි වේ. (    )

08. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක සියලු පුරවැසියන්ට අසමාන අවස්ථා ලබා දිය යුතුය. (    )

09. සමාජයට නායකත්වය සපයන පුද්ගලයින්ගේ ස්වභාවය හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් අනුව එම නායකයන් දරන නායකත්ව ශෛලීන් ඒකාකාර වේ. (    )

10. ලෝකයේ බොහෝ රටවල ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයි. (    )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- A රූපය ඇසුරින් පහත 11 - 13 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A රූපය

11. A රූපයේ දැක්වෙන්නේ බෞද්ධයන්ට ඉතා වැදගත් ආගමික ස්ථානයක් වන ................................................................ යයි.

12. එය පිහිටා ඇත්තේ ................................................................ දිස්ත්‍රික්කයේ ය.

13. එම ආගමික ස්ථානය හා සම්බන්ධ වැදගත් උත්සවයක් ලෙස ................................................ උත්සවය දැක්විය හැකි ය.

14. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සැමරීම සඳහා සෑම වසරකම ......................................................... පවත්වනු ලැබේ.

15. මුස්ලිම් ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස සලකනු ලබන ......................................................... වන්දනා සමයේ සැමරීම සඳහා හජ්ජි උත්සවය පවත්වනු ලබයි.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. පෘථිවිය අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලියක් ලෙස දැක්විය හැක්කේ මින් කුමක් ද?

    (1) සුනාමි (2) කුනාටු (3) ගංවතුර (4) ලැව්ගිනි

17. අකුණු වලින් සිදුවන හානි වලක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?

    (1) හුදකලා ස්ථානවල රැඳී සිටීම. (2) උසින් වැඩි ගස් යට රැඳීම.

    (3) විදුලි උපකරණ හා පේනු ගලවා දැමීම. (4) එළිමහන් තැනක නිදහසේ සිටීම.

18. ස්වභාවික විපත් අවමකර ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?

    (1) කැලෑ කපා ගිනි තැබීම

    (2) දිරාපත් නොවන ද්‍රව්‍ය භාවිතයට ගැනීම වැඩි කිරීම

    (3) කඩොලාන ශාක ආරක්ෂා කිරීම

    (4) කොරල්පර කඩා දැමීම.

19. ආහාර මගින් සිදුවන අනතුරු වලක්වා ගැනීම සඳහා ඔබ ක්‍රියා කළ යුතු ක්‍රියාමාර්ගයක් අඩංගු පිළිතුර තෝරන්න.

    (1) කල් ඉකුත් වූ ආහාර භාවිතයට ගැනීම. (2) ආහාර නිසි පරිදි පිස භාවිතයට ගැනීම.

    (3) කෘතිම ලෙස නිපදවූ ආහාර වැඩිපුර අනුභවය. (4) සේදීමකින් තොරව ආහාර අනුභව කිරීම.

20. අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරන ආයතනයක් ලෙස,

    (1) අක්ෂිදාන සංගමය දැක්විය හැකි ය. (2) සෞඛ්‍යදාන සේවා දැක්විය හැකි ය.

    (3) ශිෂ්‍යභට කණ්ඩායම් දැක්විය හැකි ය. (4) රතුකුරුස සංගමය දැක්විය හැකි ය.

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



- **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 04 කටත් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් හිමිවන අතර අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් හිමි වේ.**

01. (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති විශේෂ සේවා දෙකක් ලියන්න.

(ii) බ්‍රිතාන්‍ය පාලන සමයේ ආරම්භ කළ පොදු සේවා දෙකක් ලියන්න.

(iii) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න.

(iv) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට ක්‍රියාත්මක වන ආයතන දෙකක් ලියන්න.

(v) පහත සඳහන් වගු සටහනේ නායකත්වය සඳහා නිදසුන් දක්වා ඇති අතර අනුගාමිකත්වයට අදාළ පිළිතුරු හිස්තැනෙහි ලියන්න.

| නායකයා | අනුගාමිකයා |
|---|---|
| A පියා | ........................................ |
| B විදුහල්පති | ........................................ |

(vi) බහු සංස්කෘතික සමාජ පවතින රටවලට නිදසුන් දෙකක් ලියන්න.

(vii) අප රටේ ආගම පදනම්කරගෙන ගොඩනැගී ඇති සංස්කෘතීන් දෙකක් ලියන්න.

(viii) විපත් සිදුවූ අවස්ථාවකදී හානි තවදුරටත් අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(ලකුණු 2 x 8 = 16)

02.



A - ....................................



B - ....................................

(i) ශ්‍රී ලංකාවේ පොදුසේවා සපයන ආයතනවල ලාංඡන දෙකක් ඉහත A හා B හිස්තැන්වලින් දක්වේ. ඒවා කුමන ආයතනවලට අයත්දැයි අනුපිළිවෙලට ලියන්න. (ල. 02)

(ii) පොදු සේවාවක් වන අධ්‍යාපනය මගින් ඉටුකරන කාර්යයන් තුනක් නම් කරන්න. (ල. 03)

(iii) ජලය හා විදුලිය අපට අවශ්‍ය වන ඉතා වැදගත් සේවා දෙකකි. ඉහත සේවා භුක්ති විඳින අප ඉටුකළ යුතු යුතුකම් තුන බැගින් වෙන වෙනම ලියන්න. (ල. 06)

03. (i) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ල. 02)

(ii) බහු සංස්කෘතික සමාජයකක දැකිය හැකි ගුණාංග 4ක් ලියන්න. (ල. 04)

(iii) ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩනගා ගැනීමේ වාසි පහක් ලියන්න. (ල. 05)

04.



A - ....................................



B - ....................................

(i) සමාජයේ දක්නට ලැබෙන පවුල් වර්ග ඉහත A හා B රූපසටහන්වලින් දක්වා ඇත. එම පවුල් වර්ග දෙක හඳුනාගෙන නම් කරන්න. (ල. 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ii) නායකයයෙකු සතු විය යුතු ගුණාංග හතරක් ලියන්න. (ල. 04)

(iii) පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 5 ක් ලියන්න. (ල. 05)

05. (i) පහත සඳහන් A හා B රූපසටහනේ දක්වා ඇති ස්වාභාවික ආපදා අවස්ථා දෙක නම් කරන්න.





A - ....................................  B - .................................... (ල. 02)

(ii) A අවස්ථාවට බලපාන **මානව ක්‍රියාකාරකම්** දෙකක් ද, B අවස්ථාව නිසා ඇතිවන බලපෑම් දෙකක් ද, වෙන වෙනම ලියන්න. (ල. 04)

(iii) ස්වාභාවික විපත් 3ක් සහ **මිනිස් ක්‍රියාකාරකම්** හේතු කොටගෙන ඇතිවන විපත් දෙකක් නම් කරන්න. (ල. 05)

06. (i) පහත සඳහන් A හා B පින්තූරවල තිබෙන උත්සව පැවැත්වෙන අවස්ථා අයත්වන්නේ කුමන සංස්කෘතීන්වලටදැයි අනුපිළිවෙලට නම් කරන්න. (ල. 02)



A



B

(ii) බහු සංස්කෘතික සමාජයක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ හතරක් ලියන්න. (ල. 04)

(iii) i. බෞද්ධයින්ට ඉතා වැදගත් ආගමික උත්සව තුනක් නම් කරන්න. (ල. 03)

ii. ඉස්ලාම් භක්තිකයන්ට ඉතා වැදගත් ආගමික උත්සව දෙකක් ලියන්න. (ල. 02)

07. (i) වර්තමානයේ මුහුණපෑමට සිදුවන අනතුරු හා විපත් අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල. 03)

(ii) අනතුරු හා ආපදා සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන 4ක් නම් කරන්න. (ල. 04)

(iii) රසායනික ද්‍රව්‍ය ශරීරගත විය හැකි ක්‍රම හතරක් නම් කරන්න. (ල. 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2018 - 1/2**

**08 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | බැංකු සේවා | 02. | මැලේරියාව | 03. | සන්නිවේදනය | 04. | ග්‍රාමීය ජනතාව | 05. | පවුල |
| 06. | ✓ | 07. | ✓ | 08. | × | 09. | × | 10. | ✓ |
| 11. | මිස්සක පවුව | 12. | අනුරාධපුර | 13. | පොසොන් | 14. | නත්තල් | 15. | මක්කම |
| 16. | (1) | 17. | (3) | 18. | (3) | 19. | (2) | 20. | (2) |

(2 x 20 = 40)

**II කොටස**

01. (i) සිසු සැරිය, ගැමි සැරිය
   (ii) ප්‍රවාහනය, තැපැල් හා විදුලි, බැංකු
   (iii) නායකත්වයට ගරු කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම, සැමදෙනාගේම කැමැත්ත මත විමසීම හා එකග වීම, සාකච්ඡා මගින් නිවැරදි තීරණවලට එළඹීම, උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විඳීම ආදී කරුණු
   (iv) පොලීසිය, ළමාරක්ෂක දෙපාර්තමේන්තුව, ළමා හා කාන්තා කාර්යාංශය
   (v) A පවුලේ සෙසු සාමාජිකයන් B ගුරු මණ්ඩලය සිසු දරුදැරියන්
   (vi) ශ්‍රී ලංකාව, ඉන්දියාව, අමෙරිකාව
   (vii) බෞද්ධ සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, කතෝලික සංස්කෘතිය, ඉස්ලාම් සංස්කෘතිය
   (viii) විපතට පත් වූවන් බේරා ගැනීම, ප්‍රථමාධාර නිවැරදිව ලබා දීම, විපතට පත් වූවන් රෝහල් වෙත ඉක්මනින් රැගෙනයාම ආදිය.

02. (i) A ශ්‍රී ලංකා පොලීසිය B ශ්‍රී ලංකා දුම්රිය සේවය
   (ii) නිසි පරිදි අධ්‍යාපනය ලබා දීම. නිපුනතා සංවර්ධනය කිරීම, සමාජානුයෝජනය කිරීම, සමාජයට වැඩදායක පුරවැසියන් බිහි කිරීම ආදී වශයෙන්.
   (iii) ජලය -
   - පිරිසිදු පානීය ජලය සැපයීම
   - සේවා අඛණ්ඩව සැපයීම
   - ජලය අපතේ යෑම වැලැක්වීම
   - වැඩිවන ඉල්ලුම සපුරා ලීම ආදී වශයෙන්

   විදුලිය -
   - අඛණ්ඩව සේවා සැපයීම,
   - නිසි පරිදි නඩත්තු කටයුතු සිදු කිරීම,
   - ආරක්ෂාව සහතික කිරීම
   - වැඩි වන විදුලිබල ඉල්ලුම සපුරාලීමට කටයුතු කිරීම ආදී වශයෙන්

03. (i) ඊ. බී. මයිලර්, මහාචාර්ය විමල් දිසානායක
   (ii)
   - සැම ජන වර්ගයකටම අයත් පුද්ගලයන්ට ගරු කිරීම
   - සැම ජන වර්ගයකටම අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
   - කිසිදු ජන වර්ගයක්, ආගමික කණ්ඩායකමක් උසස් හෝ පහත් කොට නොලකීම
   - තම යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම
   - සැම ආගමකම හා ජන වර්ගයකම සංස්කෘතික උරුම ආරක්සා කිරීම හා ඒවාට ගරු කිරීම ආදී ලෙස

   (iii)
   - එකිනෙකා අතර අවබෝධය ඇති වී විශ්වාසයෙන් කටයුතු කිරීම නිසා ගැටුම් අවම වේ.
   - ජන කොටස් අතර සමගිය තහවුරු වේ.
   - රට සංවර්ධනය කිරීම සඳහා සියලු දෙනාගේ දායකත්වය ලැබේ.
   - එකමුතුව හා සාමූහිකව කටයුතු කිරීමට පෙළඹීමක් ඇති වේ.
   - ඵලදායී ආර්ථික කටයුතුවල යෙදෙමින් රට සංවර්ධනය කිරීමට දායක වේ ආදී වශයෙන්

04. (i) A - න්‍යෂ්ටික පවුල B - විස්තෘත පවුල
   (ii)
   - සන්නිවේදන හැකියාව
   - ගැටළු විසඳීමේ හැකියාව
   - සැලසුම් කිරීමේ හැකියාව
   - මානව සබඳතා ආදී ලෙස

   (iii) ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම.
   සාකච්ඡා මගින් තීරණ වලට එළඹීම.
   සාමූහිකව නිවසේ කටයුතුවලට හවුල් වීම.
   සමානාත්මතාවෙන් කටයුතු කිරීම.
   දෙමාපිය, වැඩිහිටි නායකත්වයට ගරු කිරීම ....... ආදී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



05. (i) A - ගංවතුර අවස්ථාවක් B - නියං බලපෑම

(ii) A - වනාන්තර විනාශ කිරීම
වගුරු බිම් ගොඩ කිරීම
ගංගාවලින් වැලි ගොඩ දැමීම
පතල් කැනීම් ආදී ලෙස

B - පානීය ජල හිඟය
මිනිස් ජීවිත හානි
වගා බිම් විනාශ වීම
වන සතුන් විනාශ වීම ආදී වශයෙන්

(iii) ස්වාභාවික - භූ චලන, සුනාමි, භූමිකම්පා, ගංවතුර, නියඟ, අකුණු ලැව්ගිනි
මිනිස් ක්‍රියාකාරකම් - රිය අනතුරු, අනාරක්ෂිත ඉදි කිරීම්, පතල් හා කැනීම් කටයුතු නිසා ඇතිවන විපත් ආදී වශයෙන්

06 (i) A - හින්දු සංස්කෘතිය B - ක්‍රිස්තියානි

(ii) විවිධ භාෂා කථා කරන, විවිධ ජන වර්ග වෙසෙන, විවිධ ජන කණ්ඩායම්, විවිධ සිරිත් විරිත් ආදී වශයෙන්

(iii) 1. වෙසක්, පොසොන්, ඇසල
2. රාමසාන්, නබිනායකතුමාගේ උපන්දින උත්සවය
3. හජ්ජි උත්සවය

07. (i) දැනුවත් කිරීම් පිළිබඳ සැලකිලිමත් වීම., විපතට පත් වූවන් බේරා ගැනීම, ප්‍රථමාධාර නිවැරදිව ලබා දීම, විපතට පත් වූවන් රෝහල් වෙත ඉක්මනින් රැගෙන යාම ආදී වශයෙන්

(ii) රෝහල, පොලීසිය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ගිනි නිවන ඒකකය ආදී වශයෙන්

(iii) සමෙහි ස්පර්ශ වීමෙන්, ආශ්වාසයෙන්, මුඛය මගින් ශරීරගත වීමෙන්, ඇසෙහි ගෑවීමෙන්, ශරීරයේ ඇති තුවාල මගින් ආදී වශයෙන්